**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

----------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 14 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 08 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **මතය**

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.274,193 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ස්ථාවර වත්කම් යටතේ දැක්වීමෙන් ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභා අනුමැතියකින් තොරව ස්ථාවර වත්කම් රු.459,654 ක් කපා හැර තිබුණි.

(ඇ) රු.4,620,345 ක් වටිනා ණයගැති ශේෂ 06 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ රු.4,771,547 ක් වටිනා ණයහිමි ශේෂ 07 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ස්ථාවර තැන්පත් සඳහා ලැබිය යුතු පොලී ආදායම රු.46,387 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම ගිණුම්වල රු.157,707 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 26,782,957 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.16,993,994 ක් විය.

1.3.3 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 17 වන වගන්තිය | සභාව සතු ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 132(ඔ) වගන්තිය හා පළාත් පාලන කොමසාරිස් වරයාගේ 2010 මැයි 24 දිනැති අංක 12/ආ/1 දරන ලිපිය | අමාත්‍යවරයාගේ පූර්ව අවසරයකින් තොරව සුභ ඌව සාධක සමිති ගොඩනැගිල්ලක් සඳහා සාධක විදුලිය ලබාදීමට රු.18,500 ක් ආධාර වශයෙන් ගෙවා තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) 180 වන රීතිය හා ඌව ප්‍රධාන ලේකම්ගේ 24 දිනැති අංක 2/මු/1 ලිපිය | ඇප තැබිය යුතු නිලධාරීන් 04 දෙනෙකු විසින් පළාත් රු.22,000 ක් වටිනාකම ඇප තැන්පත් කර 2010මාර්තු නොතිබුණි. |
| (ii) 218 වන රීතිය | වර්ෂයකට වරක් හෝ ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂා කිරීම සිදුකළ යුතු වුවද, 2015 වර්ෂයේ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලැබූ හා සේවය හැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 168,750 ක් වූ සේවක ණය අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>-----------------------------<br>1990 ඔක්තෝබර් 10 දිනැති අංක41/90 දරන චක්‍රලේඛය | ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු නොකර 2015වර්ෂයේදී ලොරිය රථ හා බැකෝ යන්ත්‍රය සඳහා රු.180,417 ක් වටිනා ඉන්ධන ලීටර් 1899 ක් භාවිතා කර තිබුණි. |
| (ඉ) | 1980 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තිය | සභා බල ප්‍රදේශය තුල වාර්ෂිකව ක්‍රියාත්මක වන පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,431,704 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,916,499 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාලව ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ අක්කර බදු සහ ජල ගාස්තු ආදායම් අයකර ගැනීම 6% - 38% අතර වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල අක්කර බදු හා ජල ගාස්තු ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 0% හා 31% වන බැවින් සභාවේ ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය වී තිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.5,339,484 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.8,693,071 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ ගාල්වල ත්‍රීරෝද රථවලින් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල සම්ප්‍රේෂණ කුළුණු 7 ක් පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

2014 වර්ෂයට අදාලව සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ 2015 දෙසැම්බර් 31 දින වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි.

3.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේ දී රු.35,855,811 ක් වැයකර බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල, පුස්තකාලය, සතිපොල හා වැසිකිලි පද්ධතිය ඉදිකිරීම සඳහා සභාව සතු කිණිගම ක්‍රීඩා භූමිය වෙනුවට දුම්රිය දෙපාර්තමේන්තුව සතු රක්ෂිත භූමිය තෝරා ගෙන වාර්ෂිකව රු.109,760 ක බදු කුලියකට වර්ෂ 05 ක බදු ගිවිසුමකට හා මාර්ග රක්ෂිතයට අයත් මීටර් 15 තුළට ඉදිකිරීම් අයත් වන බැවින් පළාත් මාර්ග අධ්‍යක්ෂක සමඟ නිර්වන්දි ගිවිසුමකට එළඹ තිබුණි.

(ආ) බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ බිම ටයිල් ඇල්ලීම වෙනුවෙන් නිමි වැඩ වටිනාකමට වඩා රු.155,873 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

-----------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයෙහි ආදායම් හා වියදම් පාලනය කිරීම සඳහා ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2015 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකොට නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

--------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) වත්කම් කළමනාකරණය

(ඊ) තොග පාලනය

(උ) වාහන පාලනය